ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: **තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - I** | කාලය Time: පැය 02 |

නම : ..........................................................................................................

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.

(01) තර්ක ශාස්ත්‍රය විකාශනයේ අනුපිළිවෙල වන්නේ,
(1) ග්‍රීක, මධ්‍යතන, සමකාලීන, නූතන
(2) පූර්ව ග්‍රීක, අධ්‍යතන, මධ්‍යතන, නූතන
(3) නූතන, මධ්‍යතන, අධ්‍යතන, සමකාලින
(4) ග්‍රීක, මධ්‍යතන, නූතන, සමකාලීන
(5) සමකාලීන, මධ්‍යතන, නූතන, ග්‍රීක

(02) තර්ක ශාස්ත්‍රය පිළිබඳ නිර්වචනයක් නොවන්නේ,
(1) නිවැරදිව සිතීමට හා අදහස් ප්‍රකාශ කිරීමේ ක්‍රමය තර්ක ශාස්ත්‍රය යි.
(2) සත්‍ය අවබෝධ කිරීමට මඟ පාදන විෂයකි.
(3) නිවැරදිව සිතීමට හා අදහස් ප්‍රකාශ කිරීමේ ක්‍රමය කරන ශාස්ත්‍රය යි.
(4) තර්ක ශාස්ත්‍රය යනු රූපික විද්‍යාවක් නොවන්නකි.
(5) උද්ගාමී හා නිගාමී තර්ක සැසඳීම තර්ක ශාස්ත්‍රය යි.

(03) ප්‍රස්තුතයක අන්තර්ගත නොවිය යුතු ලක්ෂණයකි,
(1) සත්‍ය හෝ අසත්‍ය ප්‍රකාශයක් වීම (2) පිළිගත් රීතීන්ට අනුකූලවීම
(3) උක්ත ආඛ්‍යාතය නිසි පරිදි ගැලවීම (4) අර්ථවත් ප්‍රකාශනයක් වීම
(5) වැඩි දෙනෙකු විසින් පිළිගනු ලැබිය හැකිවීම.

(04) ස්වාර්ථ අනුමානයේ දක්නට ලැබෙන අවයව තුන හා නිගමනය නිවැරදිව දැක්වෙන අනුපිළිවෙළ වන්නේ,
(1) සාධ්‍ය, හේතු, පක්ෂ, ව්‍යාප්ති (2) ව්‍යාප්ති, පක්ෂ, හේතු, සාධ්‍ය
(3) සාධ්‍ය, පක්ෂ, හේතු, ව්‍යාප්ති (4) පක්ෂ, සාධ්‍ය, හේතු, ව්‍යාප්ති
(5) ව්‍යාප්ති, සාධ්‍ය, පක්ෂ, හේතු

(05) ප්‍රස්තුත දෙකක් හෝ ඊට වඩා වැඩි ගණනක් එකතු වී සෑදෙන ප්‍රස්තුත
(1) සෝපාධික (2) වියෝජක (3) සංයෝජක
(4) සංකීර්ණ (5) සරල ප්‍රස්තුත වේ

(06) සාමාන්‍ය පදයකට විශේෂණ පදයක් එකතු කළ විට එම පදය හැඳින්වෙන්නේ,
(1) සංයුක්ත පදයකි (2) වියුක්ත පදයකි (3) සමුහවාචී පදයකි
(4) සාමාන්‍ය පදයකි (5) ඒකීය ලෙස විස්තරාත්මක පදයකි

(07) නිරීක්ෂණ වාක්‍ය නිශ්චිත ඒවා ලෙස පිළිගැනීම
(1) උපන්‍යාසයෙන් අනාවැකි බිහි කරගැනීම නිසා සිදුවන්නකි.
(2) ප්‍රාථමික කරුණු සහාය කරගෙන අනාවැකි ලබාගැනීම නිසා සිදුවේ.
(3) නිගාමී අසත්‍යකරණවාදයේ දුර්වලතාවයකි.
(4) සහායක උපන්‍යාස තුලින් අනාවැකි ලබා ගැනීමකි.
(5) අසත්‍යකරනය හඳුන්වාදීමෙන් සාම්ප්‍රදායික ක්‍රමයෙන් බැහැර වීමකි.

(08) කුලකයක් කුලක අනුපූරකයත් එකතුවීමෙන් සෑදෙන්නේ

(1) අභිශූන්‍ය කුලකය (2) උපකුලකය (3) වියුක්ත කුලකය
(4) කුලකමේලය (5) සර්වත්‍ර කුලකය

(09) සමහර භික්ෂූන් ධර්ම කථිකයන් වන බැවින් හා කිසිම ගිහියෙකු භික්ෂුවක් නොවන හෙයින් සමහර ධර්ම කථිකයන් ගිහියන් ය.

(1) සප්‍රමාණය
(2) අයථාසාධ්‍යපද ආභාෂයට හසුවී ඇත.
(3) එක් අවයවයක් නිශේධන නම් නිගමනයද නිශේධන විය යුතුය යන රීතිය බිඳ ඇත.
(4) අව්‍යාප්ත මධ්‍ය පද ආභාෂයට හසුවී ඇත.
(5) එක් අවයවයක් වත් ප්‍රතිජානන විය යුතුය යන රීතිය බිඳී ඇත.

(10) අනුගාමික පදනම්වාද එකිනෙකට අසංගත හා අසමමේය වේ. එයට උදාහරණ නොවන්නේ,

(1) පෘථිවි කේන්ද්‍රවාදය හා සූර්ය කේන්ද්‍රවාදය (2) ගුරුත්වාකර්ෂණවාදය හා සාපේක්ෂවාදය
(3) ප්ලොජිස්ටන් වාදය හා ඔක්සිකරණ වාදය (4) ගුරුත්වාකරන වාදය හා ත්වරණවාදය
(5) ගුරුත්වාකරණවාදය හා පෘථිවිකේන්ද්‍ර වාදය

(11) සෑම විටම සාධ්‍ය අවයවය සාමාන්‍ය ප්‍රස්තුතයක් වී පක්ෂ අවයව ප්‍රතිජානන විය යුතු සප්‍රමාණ උප ප්‍රකාරය වන්නේ,

(1) පළමු ප්‍රකාරය (2) දෙවන ප්‍රකාරය (3) තුන්වන ප්‍රකාරය
(4) සිව්වන ප්‍රකාරය (5) මෙය ප්‍රකාර රීතියක් නොවේ

(12) සිව්වන ප්‍රකාරයට අයත් උපප්‍රකාරයක් නොවන්නේ,

(1) BRAMANTIP (2) CAMENOS (3) DIMARIS
(4) FELAPTON (5) FESAPO

(13) සංවාක්‍ය ස්වරූපයට බිඳගැනීමේදී නිගමනය ගම්‍ය කරගත හැකි ඉඟියක් නොවන්නේ මින් කුමක් ද?

(1) නිසා (2) නම් (3) හෙයිනි (4) බැවින් (5) එමනිසා

(14) අවයව දෙකම විශේෂ ප්‍රස්තුත වන විට සප්‍රමාණ නිගමනයක් ලබාගත නොහැකිවන්නේ පහත දැක්වෙන කුමන දෝෂයට ලක්වන හෙයින් ද?

(1) අයථා සාධ්‍ය පද දෝෂයට (2) අව්‍යාප්ත මධ්‍යපද දෝෂය
(3) අයථා පක්ෂ පද දෝෂයට (4) අයථා පක්ෂ පදහා සාධ්‍ය පදදෝෂය
(5) අයථා සාධ්‍ය පද හා අව්‍යාප්ත මධ්‍ය පද දෝෂය

(15) පරිවර්තන ක්‍රියාවලියට භාජනය කල නොහැක්කේ කුමන ප්‍රස්තුතයද,

(1) A (2) E (3) I (4) O (5) සියල්ල භාජනය කළ හැක.

(16) උපාශ්‍රයන ප්‍රතියෝගයට අදාළව සත්‍ය ප්‍රකාශය මින් කුමක් ද?

(1) I අසත්‍ය වන විට E අවිනිශ්චිත වීම (2) O සත්‍යවනවිට E අසත්‍ය වීම
(3) I සත්‍ය වන විට A අවිනිශ්චිත වීම (4) E සත්‍යවන විට O අසත්‍ය වීම
(5) I අසත්‍ය වන විට A අවිනිශ්චිත වීම

(17) පරස්ථාපිත ප්‍රස්තුතයේ තාර්කික ව්‍යුහය වන්නේ,

(1) $\overline{P}S$ (2) $S\overline{P}$ (3) SP (4) $\overline{S}\,\overline{P}$ (5) $\overline{S}P$

(18) සමහර පළතුරු දොඩම් නොවේ. එහෙයින් සමහර පලතුරු දොඩම් නොවන ඒවා වේ, ඒ තර්කය
(1) සප්‍රමාණය, ප්‍රතිවර්තනයකි
(2) නිෂ්ප්‍රමාණ අයථා පරස්ථාපනයකි
(3) සප්‍රමාණ ප්‍රතිවර්තික පරිවර්තනයකි
(4) නිෂ්ප්‍රමාණ අයථා ප්‍රතිලෝමානයකි
(5) නිෂ්ප්‍රමාණ අයථා ප්‍රතිවර්තිත පරස්ථාපනයකි.

(19) විද්‍යාවක් වුවද පොපරේගේ වෙන්කරගැනීමේ රීතියට අදාළ කරගත නොහැක්කෙ 'මින් කුමන විෂයද?
(1) භෞතික විද්‍යාව (2) තාරකා විද්‍යාව (3) පුරා විද්‍යාව
(4) ශුද්ධ ගණිතය (5) කාලගුණ විද්‍යාව

(20) ක්‍රියාව දක එහි හේතුව අනුමාන කිරීම අයත් වන්නේ,
(1) ශේෂවත් අනුමානයට (2) පූර්වවත්ව අනුමානයට (3) සාමාන්‍ය අනුමානයට
(4) පරාර්ථ අනුමානය (5) ප්‍රත්‍යක්ෂ අනුමානයට

(21) පෘථිවිය අසල ඇති වස්තුවක වේගය වැඩිවන්නේ පතිතවන දුර ප්‍රමාණයට සාපේක්ෂකවයි යන මතය ඉදිරිපත් කලේ,
(1) ගැලීලියෝ (2) නිව්ටන් (3) ඇරිස්ටෝටල්
(4) ප්ලේටෝ (5) කොපර්නිකස්

(22) විද්‍යාවක පදනම්වාද වෙනස්වීම ඒ විද්‍යාවේ විප්ලවයක් ලෙස හැඳින්වූ සමකාලීන දාර්ශනිකයා වන්නේ,
(1) ස්ටීවන් ටුල්මින් (2) පෝල් පයරාබන්ඩ් (3) රසල් හැන්සන්
(4) තෝමස් කුන් (5) මයිකල් පොලොන්සි

(23) විද්‍යාඥයන් නව පදනම් වාදයක් වෙත සිත යොමු කරන්නේ කුමක් හේතවෙන් ද?
(1) පදනම් වාදය අසංගත හා අසමමෙය වනවිට
(2) පදනම් වාදය බිඳවැටී නව පදනම්වාදයක් ඇතිවිට
(3) අනියමයන් එකතවී පදනම්වාදය පිළිබඳ අර්බුද පැන නැගුන විට
(4) පදනම්වාද අනුයාතවන විට
(5) පදනම්වාද අසංගත වන විට

(24)

| | | |
|---|---|---|
| $A\bar{B} =$ | $AB \neq$ | $A\bar{B} =$ |
| $C\bar{B} =$ | $A\bar{C} =$ | $CB =$ |
| $\therefore C\bar{A} =$ | $\therefore CB \neq$ | $\therefore CA =$ |

වෙන් රූප සටහන් ක්‍රමයට අනුව මෙම තර්කවල සප්‍රමාණතාව විමසු විට,
(1) a පමණක් සප්‍රමාණ වේ (2) b පමණක් සප්‍රමාන වේ
(3) C පමණක් සප්‍රමාණ වේ (4) a හා b පමණක් සප්‍රමාණ වේ
(5) b හා c පමණක් සප්‍රමාණ වේ

(25) ආචාර විද්‍යාව, සංගීතය, නර්තනය යන විෂයන් අයත් වන්නේ,
(1) සමාජ විද්‍යාව (2) සංස්ලේෂි විද්‍යාව (3) ඇගයුම්ශීලි විද්‍යාව
(4) විශ්ලේෂි විද්‍යාව (5) ශුද්ධ විද්‍යාව

(26) පොපර්ගේ රීතියට අනුව විද්‍යාවක් වන විෂය කුමක් ද?
(1) ශුද්ධ ගණිතය (2) යකුන් නැටීම (3) සෘග්වේදය
(4) නර්තනය (5) මානව විද්‍යාව

(27) උද්ගාමී ක්‍රමය හඳුන්වාදුන්නේ,
(1) ගැලිලියෝ ගැලිලි (2) ෆ්‍රැන්සිස් බේකන් (3) ජේ.එස්. මිල්
(4) තෝමස්කුන් (5) කාර්ල් හෙම්පල්

(28) ව්‍යාජ විද්‍යාවක් නොවන්නේ,

(1) යාතු කර්ම (2) ජ්‍යොතිෂය (3) මනෝ විද්‍යාව
(4) අභිචාර (5) හස්තරේඛා ශාස්ත්‍රය

(29) ලයිබ්නිට්ස්ට අනුව යම් සිද්ධියක් එය සිදුවන ආකාරයෙන් මිස වෙනත් ආකාරයකින් සිදු නොවීමට අවශ්‍ය හේතුවක් ඇත. යන්න හඳුන්වන්නේ,

(1) තදාත්මීය නියමය (2) අවිසංවාදී නියමය (3) පර්යාප්ත හේතු නියමය
(4) ද්විත්ව නිශේධ නියමය (5) මධ්‍ය බහිෂ්කෘත නියමය

(30) කාර්ල් පොපරේ විද්‍යාඥයාගේ කාර්යය ලෙස දකින්නේ,

(1) විධික්‍රම හඳුන්වාදීම
(2) උපන්‍යාස ගොඩනැගීමේ ක්‍රම හඳුන්වාදීම
(3) උපන්‍යාස පරීක්ෂණ අනුව බැහැර කිරීමට උත්සාහ කිරීම.
(4) අනාවැකි පල කිරීමට උත්සහ කිරීම
(5) අනුභූතික පරීක්ෂණ පමණක් සිදු කිරීමට උත්සාහ කිරීම.

(31) විද්‍යාවේ තාර්කික ව්‍යුහයන් තමා දකින ආකාරයෙන් ඉදිරිපත් කිරීම

(1) විද්‍යාඥයාගේ කාර්යයි (2) තාරකා විද්‍යාඥයාගේ කාර්යයි
(3) විධික්‍රම වාදියාගේ කාර්යයි (4) දාර්ශනිකයාගේ කාර්යයි
(5) පරීක්ෂකවරයාගේ කාර්යයි

(32) නිගාමී සත්‍යෝක්ෂණවාදය නිගාමී වශයෙන් සප්‍රමාණ නොවන්නේ,

(1) පූර්වාංග අභාස නිසා (2) අපරාංග ආභාස නිසා
(3) උද්ගාමී ලක්ෂණ නිසා (4) නාස්ථිප්‍රකාරය නිසා
(5) අස්තිනාස්ථි ප්‍රකාරය නිසා

(33) කොටුකර ඇති වාක්‍ය අසත්‍ය වේ මෙහි ඇති තාර්කික දෝෂය වන්නේ,

(1) කාකතාලිය ආභාසය (2) ශබ්ද ජල අභ්‍යාසය
(3) අපරාංග ආභාසය (4) විරුද්ධාභාසය
(5) පූර්වාංග ආභාසය

(34) බාල මහලු යන පද යුගලය

(1) විසංවාදී පදය (2) ප්‍රත්‍යතීක පද වේ (3) වෛකල්‍ය වාචී පද වේ
(4) වියුක්ත පද වේ (5) සමූහ පද වේ

(35) නිරුපාධික සංවාංක්‍යය ප්‍රකාරය රැඳී ඇත්තේ,

(1) සාධ්‍ය පදයේ ව්‍යාප්තිය මතය
(2) පක්ෂ පදයේ ව්‍යාප්තිය අනුවය
(3) පක්ෂ හා සාධ්‍ය පදය නිගමනයේ තිබෙන ස්ථානය මතය
(4) මධ්‍ය පදය තිබෙන ස්ථානය මතය
(5) පක්ෂ පදය තිබෙන් ස්ථානය මතය

(36) ''සමහර සිසුන් ප්‍රඥාවන්තය'' යන්නෙහි ප්‍රතිවර්තනය

(1) සමහර සිසුන් ප්‍රඥාවන්ත නැත
(2) සියලු සිසුන් ප්‍රඥාවන්ත වේ
(3) සමහර සිසුන් ප්‍රඥාවන්ත නොවන්නේ නොවේ.
(4) කිසිම සිසුවෙක් ප්‍රඥාවන්ත නොවන්නේ නොවේ.
(5) සමහර ප්‍රඥාවන්ත අය සිසුන් ය.

(37) ඉදින් A, B, C යන ඒවා වර්ග නම් $AB = \phi$ හා $C \neq \phi$ එවිට,

(1) $BC = \phi$ (2) $A \neq \phi$ (3) $ABC = \phi$ (4) $\bar{A}\,\bar{C} \neq \phi$ (5) $AC \neq \phi$

(38) සියලු වැන්දඹුවන් විවාහ වුවන් ය'' යන වාක්‍යය පිළිබඳ පහත කුමන ප්‍රකාශයක් සත්‍ය ද?
(1) අසත්‍ය වීමට ඉඩ ඇත (2) අසත්‍ය යි (3) විශ්ලේෂී සත්‍යයකි
(4) සත්‍යතාව නිශ්චය කල නොහැක (5) විශ්ලේෂී අසත්‍යයකි

(39) O ප්‍රස්තුතය අසත්‍ය වූ කල ඊට අනුරූප වන AEI යන ප්‍රස්තුතවල පිළිවෙළින් සත්‍යතා ඇගයුම වන්නේ කුමන ඒවා ද?
(1) සත්‍යයි, අසත්‍යයි, අනියතයි (2) අනියතයි, සත්‍යයි, අසත්‍යයි
(3) සත්‍යයි, අසත්‍යයි, සත්‍යයි (4) අනියතයි, අසත්‍යයි, අසත්‍යයි
(5) සත්‍යයි, අසත්‍යයි, අසත්‍යයි

(40) සර්වවාචී නිශේධන ප්‍රස්තුතයක ප්‍රතිලෝමය ලබාගැනීමේදී ලැබෙන ප්‍රස්තුත පිළිවෙල පහත සඳහන් ඒවායින් කුමක් ද?
(1) E, A, I, E (2) E, E, A, I (3) E, A, I O (4) E, I A, O (5) E, E,I,O

(41) ඒකාධිවාචී ප්‍රතිජානන සහ ඒකාධිවාචී නිශේධන ප්‍රස්තුත අතර ප්‍රතියෝග චතුරස්‍රයෙහි සම්බන්ධය ඇත්තේ,
(1) විසංවාදයේදී (2) ප්‍රත්‍යනික ප්‍රතියෝගයේ දී
(3) උපප්‍රත්‍යනීක ප්‍රතියෝගයේ දී (4) උපාශ්‍රනයේ දී
(5) විපරීත ප්‍රතියෝගයේදී

(42) නිගාමී ලෙස සප්‍රමාණ තර්කයක් දක්නට ලැබෙන විද්‍යාවේ විධික්‍රමය මින් කුමක් ද?
(1) නිගාමිසත්‍යොක්ෂණවාදය (2) නිගාමී අසත්‍යොක්ෂණ වාදය
(3) සාපේක්ෂ වාදය (4) හෙම්පල් නේගල් ආකෘතිය
(5) උද්ගමනවාදය

(43) නූතන සංකේත ක්‍රමය අනුව සංකේත කලවිට සංකේත වාක්‍ය දෙකක් ගොඩනැගිය හැකි ප්‍රකාශය වන්නේ,
(1) වහින්නේනම් ගංගා පිටාර ගලයි
(2) වහින අතර ගංගා පිටාර ගලයි.
(3) වහින්නේ නම් පමණක් ගංගා පිටාර ගලයි.
(4) වහින්නේ නම් ගංගා පිටාර ගලයි යන්න අසත්‍යයි
(5) වහින්නේ නම් ගංගා පිටාර ගලයි යන ප්‍රකාශය අසත්‍ය වේ

(44) වැසි වසී - P පොළව තෙමයි - Q ලෙස සංකේපන රටාවදී ඇති විට වැසි වසින්නේවත් පොළව තෙමෙන්නේවත් නැත'' යන්නෙහි සංකේත කරණය වන්නේ,
(1) $(P \wedge Q)$ (2) $N(P \vee Q)$ (3) $N(P \wedge Q)$ (4) $(NP \wedge NQ)$ (5) $(NP \vee NQ)$

(45) නවීන විද්‍යාවේ මෙන්ම විද්‍යාවේ විධි ක්‍රමයේද පියා ලෙස සලකුණු ලබන්නේ,
(1) අයිසෙක් නිව්ටන් (2) ඇරිස්ටෝටල් (3) අයින්ස්ටයින්ය
(4) ගැලීලියෝ ය (5) ප්‍රැන්සිස් බේකන්ය

(46) මධ්‍යකාලීන යුගයට අයත් නොවන දාර්ශනිකයකු වන්නේ,
(1) සොක්‍රටීස්ය (2) ඩාන්ටේය (3) ඔකම්හි විලියම්ය
(4) තෝමස් ඇක්වයිනාස්ය (5) රොජර් බේකන්ය

(47) ආනුභූතික විද්‍යා ඥානයට පදනම් වන්නේ,
(1) බුද්ධිය (2) ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය (3) දර්ශනය
(4) විද්‍යාඥයන් (5) බුද්ධිය හා ඉන්ද්‍රිය ප්‍රත්‍යක්‍ෂය

(48) 'මිනිසුන් නැත' යන වාක්‍ය වර්ගතර්ක ශාස්ත්‍රයට අනුව සංකේත කලවිට නිවැරදි පිළිතුර වන්නේ කුමක් ද?

(1) $A \neq \phi$ (2) $A = \phi$ (3) $\bar{A} = \phi$

(4) $\bar{A} \neq \phi$ (5) $AB = \phi$

(49) මිනිසුන් පමණක් බුද්ධිමත් වේ. යන ප්‍රස්තුතය

(1) මිනිසුන් යන පදය පමණක් ව්‍යාප්තය

(2) බුද්ධිමත් යන පදය පමණක් ව්‍යාප්තය

(3) බුද්ධිමත් යන පදය පමණක් අව්‍යාප්තය

(4) මිනිස්සු සහ බුද්ධිමත් යන පද දෙකම අව්‍යාප්තය

(5) මිනිස්සු සහ බුද්ධිමත් යන පද දෙකම ව්‍යාප්තය

(50) ''විද්‍යාව උද්ගමනය පමණක් නොව...........ඥාන මාර්ගය කරගනී'' හිස්තැනට ගැළපෙන වචනය වන්නේ,

(1) අනාවැකි (2) ප්‍රත්‍යක්ෂ කරුනු (3) ප්‍රති උද්ගමනය

(4) උපන්‍යාස (5) සහායක උපන්‍යාස

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය - II | කාලය Time: පැය 03 |

නම : ....................................................................................................

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය.
- එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් තොරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- අමතර කියවීම් කාලය විනාඩි 10

## I කොටස

(01) (i) S සමහරක් P වේ. යන ප්‍රස්තුතයේ ප්‍රතිවර්තනය කුමක් ද?

(ii) ශුන්‍ය වර්ගයේ නිර්වචනය කුමක් ද?

(iii) පළමුවැනියා අන්තිමය යන පද යුගල කුමන පද ප්‍රභේදයකට අයිති ද?

(iv) සමහර උගතුන් දාර්ශනිකයන් වේ. යන ප්‍රස්තුතයේ වාච්‍ය, වාචක ව්‍යාප්තද, අව්‍යාප්ත ද?

(v) විද්‍යාව සමාජයක් විසින් ගොඩනගන්නක් බව විසිවන සියවසේ මැද භාගයේදී අවධාරණය කළ විද්‍යාවේ කැපීපෙලෙන ඉතිහාසයඥයා සහ විධි ක්‍රමවේදියා කවුරුන් ද?

(vi) ප්‍රමානයෙන් මෙන්ම අර්ථයෙන් සමාන ප්‍රස්තුත දැකිය හැක්කේ කුමන ආකයනයේ ද?

(vii) ගායකයන් මෙන්ම වාදකයන් ප්‍රසිද්ධ අයවේ. සුදුසු සංක්ෂේපන හා රටාවක් යොදාගෙන සංකේත කරන්න.

(viii) ඍජුකෝණයක් කෝණයකි' යන ප්‍රකාශය කුමන විදියේ සත්‍යක් ද?

(ix) තර්ක ශාස්ත්‍රයට ගනිතමය පදනමක් දෙනු ලැබුවේ කවුරුන් ද?

(x) ''රූපික තර්ක ශාස්ත්‍රය'' නම් ග්‍රන්ථය රචනා කළේ කවුරුන් ද?

(02) (අ) පහත දැක්වෙන ඒවා අතර වෙනස්කම් මොනවා ද?

(i) අව්‍යවහිත සහ ව්‍යවහිත අනුමානය

(ii) විසංවාදි ප්‍රතියෝගය ප්‍රත්‍යනීක ප්‍රතියෝගය

(ආ) (i) ප්‍රතියෝග චතුරස්‍රයේ විශේෂ ප්‍රස්තුත සත්‍ය වන විට සර්වවාචී (සාමාන්‍ය) ප්‍රස්තුත දෙක ගන්නා ඇගයුම් මොනවා ද?

(ii) ප්‍රතියෝග චතුරස්‍රය වනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ප්‍රස්තුතවල) (ලකුණු 8)

(ඉ) පහත දැක්වෙන සංවාක්‍ය සප්‍රමාන ද නිෂ්ප්‍රමානද නිගමනය කරන්න. නිෂ්ප්‍රමාණ නම් බිඳ ඇති රීතියද සිදුවී ඇති අභාසය ද දක්වන්න.

(i) කිසිම නළුවෙක් ක්‍රීඩකයෙක් නොවේ. රඟපෑමට හැකියාව ඇති සැමදෙනෙක් ම ක්‍රීඩකයන් ය. එහෙයින් නළුවන් කිසිවෙක් රඟපෑමට හැකියාව ඇති අය නොවේ.

(ii) සමහර ශිෂ්‍යයන් දඟ කරති. දඟ කරන අයට දඬුවම් ලැබේ. එහෙයින් සමහර ශිෂ්‍යයින්ට දඬුවම් ලැබේ. (ලකුණු 8)

(03) (අ) පහත දැක්වෙන තර්ක වර්ග යොදාගනිමින් සංකේත කර වෙන් රූප යොදාගනිමින් සප්‍රමාණ නිෂ්ප්‍රමාණතාවය නිගමනය කරන්න.

(i) සියලු මැණික් වටිනාදේය. දිලිසෙන දේ මැණික් වේ. එබැවින් දිලිසෙන දේ වටිනා දේය.

(ii) ගස් මෙන් ම වැල් ද ප්‍රයෝජනවත් ය. එබැවින් සියලු ගස් වැල් වේ.

(iii) රාවණ නිර්භීතය. නිර්භීත සියලු දෙනා ආශිර්වාද ලැබිය යුත්තෝ ය. එහෙයින් රාවණා ආශිර්වාද ලැබීමට සුදුසු ය.

(iv) චීස් පමණක් මිල අධිකය. සමහර මිල අධික දේ රසවත් වේ. එහෙයින් රසවත් සමහර දේ චීස් වේ. (ලකුණු 12)

(ආ) පහත දැක්වෙන වාක්‍ය වෙන්රූප සටහන් අනුව සංකේත කරන්න. රූප සටහනක් ද අදින්න.

(i) මේ පොත නවකතාවක් නොවේ.

(ii) උත්සාහවන්තයෝ පමණක් ජය ගනී.

(iii) මල් සමහරක් පිපී ඇත. (ලකුණු 4)

(iv) ඇය උගත් හෝ බුද්ධිමත් නොවේ.

(04) (අ) ප්‍රතිවර්තනය යන්න හඳුන්වා දෙමින් ''සමහර මිනිසුන් දෙවියන් නොඅදහන්නෝ වෙති' යන ප්‍රස්තුතයේ ප්‍රතිවර්තනය ලියා දක්වන්න. (ලකුණු 4)

(ආ) 'කිසිම මිනිසෙක් බුද්ධිමත් නොවේ' යන වාක්‍යයේ උපශ්‍රයනය කුමක් ද? (ලකුණු 2)

(ඉ) 'මඳ කිපුණු ඇතුන් පෙරහැරේ ගමන් කරයි.' යන වාක්‍යයේ පද හඳුන්වා, ඒවායේ ව්‍යාප්තිය දක්වන්න. (ලකුණු 4)

(ඊ) (i) A ප්‍රස්තුතයක ප්‍රතිලෝමනය කුමන ප්‍රස්තුතයක් ලැබේ ද?

(ii) E ප්‍රස්තුතයක ප්‍රතිවර්ත්‍ය පරස්ථාපිතය කුමන ප්‍රස්තුතයක් ලැබේ ද?

(iii) I ප්‍රස්තුතය පරිවර්තවනය කුමන ප්‍රස්තුතයක් ලබාදේ ද? (ලකුණු 6)

(05) (අ) තර්කනයට මූලිකවන චින්තන නියම හඳුන්වාදෙන්න. (ලකුණු 6)

(ආ) අවිරෝධතා නියමය උදාහරණයකින් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(ඉ) නූතන තර්ක ශාස්ත්‍රඥයන් ඉදිරිපත් කල ප්‍රමාණකාරක ප්‍රස්තුත මොනවාදැයි හඳුන්වා දෙන්න. (ලකුණු 6)

(06) (අ) පහත දැක්වෙන භාෂාමය ප්‍රකාශන සංකේතයට නගන්න.

(i) ඉදින් වැසි ඇති වී ගඟ ගලයි යන්න දෙනු ලදනම් එවිට කුඹුරු පාලු වෙයි.

(ii) ඔහුට ගීත ගැයීමට හෝ නැටීමට හැකි නමුත් ඒ දෙකම නම් කළ නොහැක.

(iii) කමල් දුපත් වැසියෙක් නොවන නමුත් ඔහුට ඡන්ද බලය ඇත යන්න අසත්‍ය වේ

(iv) පෘථිවියවත් බ්‍රහස්පතීවත් ග්‍රහවස්තුවක් නොවේ. (ලකුණු 8)

(ආ) සංකේත රටාව ලියා සංකේතයට නගන්න.

(i) මිනිසුන් ආත්මාර්ථකාමී නොවන්නේ නම් පමණක් සමාජය ශිෂ්ඨ සම්පන්න වන අතර දිනෙන් දින ඉහල යන අපරාධ සංඛ්‍යාව අඩු වෙයි. සමාජය ශිෂ්ඨසම්පන්න වන්නේ නම් හෝ රාජ්‍ය නීති ක්‍රියාත්මක වන්නේ නම් එවිටද දිනෙන් දින ඉහලයන අපරාධ සංඛ්‍යාව අඩු වේ. රාජ්‍ය නීති ක්‍රියාත්මක වන්නේ නැත. එහෙයින් මිනිසුන් ආත්මාර්ථකාමී වන්නේ නම් දිනෙන් දින ඉහලයන අපරාධ සංඛ්‍යාව වැඩි වේ.

(ii) ශ්‍රී ලංකාවට අධික වර්ෂාවක් ලැබෙන්නේ බෙංගාල බොක්කේ කැලඹීමක් ඇත්නම් පමණි. එයින් ගම්‍ය වන්නේ බෙන්ගාල බොක්කේ කැලඹීමක් නැත්නම් ශ්‍රී ලංකාවට අධික වර්ෂාවක් ලැබෙන්නේ නැති බවය.

## III කොටස

(07) (අ) ශුද්ධ විද්‍යාවන් සම්පූර්ණ ලෙස ව්‍යවහාරික විද්‍යාවන්ගෙන් වෙනස් වේ ද? පැහැදිලි කරන්න. (ලකුණු 8)

(ආ) පොපර්ගේ විද්‍යා න. විද්‍යාවෙන් වෙන් කර ගැනීමේ රීතියට විශේෂ අවධානය යොමු කරමින් නිගාමී අසත්‍යතේක්ෂණ හා වාදය හඳුන්වා දෙන්න. (ලකුණු 8)

(08) (අ) පෘථිවි කේන්ද්‍රවාදය හා සූර්යකේන්ද්‍රවාදය වැනි උදාහරනයක් යොදාගනිමින් අනුයාතවාද අසමමේය හා අසංගක වේ යන තෝමස් කුන්ගේ මතය පැහැදිලි කරන්න. (ලකුණු 8)

(ආ) තෝමස් කුන්ගේ අර්ථයෙන් විද්‍යාත්මක විප්ලවයක් යන්න පැහැදිලි කරන්නඳ (ලකුණු 8)

(09) (අ) නව ඥානය ගොඩනැගීමට නම් ශාස්ත්‍රඥයාගේ හා ශිල්පියාගේ විධික්‍රම යා කළ යුතුය. යන ප්‍රැන්සිස් බේකන්ගේ අදහස නවීන විද්‍යාවේ දියුණුවට මග සලසන්නේ කෙසේදැයි සාකච්ඡා කරන්න. (ලකුණු 8)

(ආ) උද්ගාමී විධික්‍රමය සහ නිගාමී විධික්‍රමය අතර වෙනස්කම් පෙන්වා දෙන්න. (ලකුණු 8)

(10) (අ) පොපර්ගේ විද්‍යා න. විද්‍යා වෙන්කර ගැනීමේ රීතිය ලියා විද්‍යාත්මක මතයක තිබිය යුතු ලක්ෂණ ලියා දක්වන්න. (ලකුණු 8)

(ආ) ආනුභූතික විද්‍යාව න.ආනුභූතික විද්‍යා යන්න උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ලකුණු 8)

(11) (අ) සෞඛ්‍ය සම්පන්න ජීවිතයකට ආහාර ඉවහල් වන්නේ කෙසේදැයි පැහැදිලි කරමින් ආහාර නාස්තිය වැලැකීම සඳහා මිනිසා විසින් ඉටුකළ කළ යුතු කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 8)

(ආ) මානවයාගේ අනාගතය කෙරෙහි ආගමික මෙන්ම සදාචාරාත්මක වටිනාකම් වල අදාළත්වය ඔබ දකින ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 8)